# ඇන්ටිලොප් වර්ගයේ

# කළු මුවන් රැක ගනිමු



**Black - buck හෙවත් කළු මුවා අපට බොහෝ සෙයින්ම විරල දර්ශනයක් බව සැබෑය. ඇන්ටිලොප් වර්ගයට අයත් කළුමුවාගේ අං තට්ටුව දඟර සහිතය. විශාලව පිහිටි දෙනෙතෙහි සුදු රවුමක් වක්‍රාකාරව පිහිටා ඇත. ආකර්ශනීය පෙනුමක් ඇති කළු මුවා ඉන්දියානු ආගමික සංස්කෘතිය තුළ වැඩි වටිනාකමක් ලබා ඇති සත්ත්ව විශේෂයකි.**

ක්‍රි. පූ. 1500 - 3500 අතර ඉන්දු නිම්න ශිෂ්ටාචාරය තුළදී මෙන්ම ක්‍රි. පූ. 5000 - 2500 අතර වූ බිතු සිතුවම් නිර්මාණය තුළ කළු මුවාට විශේෂ ස්ථානයක් ලැබී ඇත. මෝගල් යුගයේ චිත්‍ර අතර කළු මුවා සුරතල් සතෙකු ලෙසින් මෙන්ම දඩයක්කාර සතෙකු වශයෙන්ද නිර්මාණය වී ඇත.

ඉන්දියානු ශාස්ත්‍රීය භාෂාවේදී සහ සාහිත්‍යයේදී මුවා / ඇන්ටිලොප් වර්ගයේ සතුන් හඳුන්වා ඇත්තේ Mrigya යන නමින් ය. නමුත් Mrigya යන නාමය බොහෝ විට කළු මුවා හඳුන්වාදීමට වඩා ඉන්දියානු උප මහාද්වීපයට ආවේණික සත්ත්ව විශේෂ වෙනුවෙන් භාවිතා කළ බවයි.

මිනිසුන්ට සමීපව ජීවත්වෙන කළු මුවා බොහෝ විට රංචු වශයෙන් හැසිරේ. සෙ.මී. 80 ක් පමණ වූ උස ඇති කළු මුවා කිලෝ ග්‍රෑම් 40 ක පමණ බරින් යුක්තය. පිරිමි මුවන්ට සෙ.මී. 50-60 ක් පමණ දිගැති අං ඇති අතර ඇතැම් ගැහැනු මුවන්ටද අං පිහිටා ඇත.

අතීතයේදී කළු මුවා ඉන්දියාව තුළ බොහෝ සුලබ දර්ශනයක් විය.

එක් ඇස්තමේන්තුවකට අනුව ඉන්දියානු උප මහාද්වීපය තුළ මිලියන 4 ක් පමණ කළු මුවන් ජීවත් වූහ.


ටී.සී. ජෝර්ඩන් රචනා කරන ලද ඉන්දියාවේ ක්ෂීරපායීන් ග්‍රන්ථයේ (187 පිටුව) සඳහන් කරන අන්දමට අද ඉන්දියාවේ නවදිල්ලිය වශයෙන් හඳුන්වන ප්‍රදේශයේදී මෝගල් පාලක 'ජහන්ජීර්' විසින් දෙසතියක කාල සීමාවේදී කළු මුවන් 426 දෙනෙක් දඩයම් කොට ඇත.


එම්.කේ. රංජිත් සිං ඇස්තමේන්තු කරන අන්දමට 1947 වර්ෂයේදී ඉන්දියාව නිදහස ලබන විට අද ගුජරාට් වශයෙන් හඳුන්වන ප්‍රදේශයේදී සිව්පා සතුන් 80,000 ක් පමණ ජීවත්ව සිටින්නට ඇත.

ඉතාම ආක්‍රමණශීලීව ගම්මාන වෙන කඩා පැන අස්වනු බෝග විනාශ කිරීමේ ගති පැවතුම් නිසා කළු මුවා සහ මිනිසුන් අතර ආරෝ වියවුල්වලට මුල පුරන්නට වූහ.

එතැනින් ආරම්භ වූ මුව - මිනිස් ගැටුමේ මූලාරම්භය කළු මුවන් වැනසී යෑමේ ආරම්භක පියවර වූවාය කිවහොත් එයද නිවැරැදිය.

මෙම වැනසී යෑමේ තර්ජනය රාජස්තාන්, පන්ජාබ්, හරියානා, ගුජරාට්, මහාරාෂ්ට, මධ්‍ය ප්‍රදේශ ඇතුළු ඉන්දියාවේ වෙනත් ප්‍රාන්ත සඳහා දැඩි සේ බලපා ඇත.





මෙම ප්‍රදේශ තුළ කළු මුවන් 40,000 ක් පමණ දැනටමත් මිනිසුන් වෙතින් විනාශයට පත්ව ඇත.

මේ නිසාම කළු මුවන් රැක ගැනීමේ අවශ්‍යතාවය දැඩි සේ දැනුන අතර කළු මුවන් වෙනුවෙන් වූ අභය භූමි ඇති කිරීමේ ව්‍යාපෘති ආරම්භ විය. රාජස්තානයේ චුරු දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද 'තල් චපාර්' අභය භූමිය මේ අතර ඉතා වැදගත් තැනක් ගනී.

ඉන්දියාව නිදහස ලබා ගත් දින සිට 1962 වර්ෂය දක්වා මෙම ප්‍රදේශය රක්ෂිත වනාන්තරයක්ව පැවති අතර 1971 වර්ෂයේ සිට අභය භූමියක තැනට පත් විය. වර්ග කිලෝමීටර් 1500 කටත් වඩා විශාල වූ මෙම ප්‍රදේශය කළු මුවන් වෙනුවෙන්ම සීමා වී ඇත.

'තල් චර්පා' අභය භූමියේ විශේෂ වැදගත්කම වන්නේ මෙම කළු මුවන්ගේ ගති පැවතුම් සඳහාම ගැලපෙන පරිදි සකස් වී තිබීමයි. විවෘත තැනිතලා ප්‍රදේශයන් වූ මෙම අභය භූමිය මෝසම් කාලයේදී දිස්වෙන්නේ කොළ පැහැති පලසක් ලෙසින්ය. තණ කොළ හොඳින් දළුලන නිසා කළු මුවන්ගේ ආහාර පිළිබඳ ගැටළුවට ඉබේටම විසඳුම් ලැබෙනු ඇත.


තල් චපාර් අභය භූමියේ කළු මුවන් මිනිසුන් ආශ්‍රයේම ගැවසෙන බවට වූ අපූරු සිද්ධීන් එමටය. අභය භූමියේ නිලධාරියෙක් ඒ පිළිබඳව සඳහන් කළ විස්තරයකි මේ.

එක් දිනක් තේ පානය වේලාවේදී මම හදිසියේම කළු මුවෙකු දක්නා කළු මුවා තේ මේසයේ තිබුන බිස්කට් පිඟානම කා දමා අහවරය. මේ

කළු මුවන් රැක ගැනීමේ අවශ්‍යතාවය දැඩි සේ දැනුන අතර කළු මුවන් වෙනුවෙන් වූ අභය භූමි ඇති කිරීමේ ව්‍යාපෘති ආරම්භ විය. රාජස්තානයේ චුරු දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද 'තල් චපාර්' අභය භූමිය මේ අතර ඉතා වැදගත් තැනක් ගනී. ඉන්දියාව නිදහස ලබා ගත් දින සිට 1962 වර්ෂය දක්වා මෙම ප්‍රදේශය රක්ෂිත වනාන්තරයක්ව පැවති අතර 1971 වර්ෂයේ සිට අභය භූමියක තැනට පත් විය. වර්ග කිලෝමීටර් 1500 කටත් වඩා විශාල වූ මෙම ප්‍රදේශය කළු මුවන් වෙනුවෙන්ම සීමා වී ඇත.

කළු මුවා අපි හැඳින්වූයේ 'මෙන්කා' නමින් ය. මෙන්කා මේ අභය භූමියට ගෙනාවේ 2002 අගෝස්තු මාසයේදී ය. ඇගේ උපත සමගම මව් මුව දෙන 'මෙන්කා' අතහැර දමා යැමත් සමගම ප්‍රදේශවාසීන් විසින් මුව පැටියා මෙම අභය භූමියට බාර දුන්නා යැයි අභයභූමි නිලධාරි 'බ්‍රිජ් ඩාන්' සඳහන් කරයි.

'මෙන්කා' ගේ භූමිකාවේ ප්‍රධාන චරිතය නිර්මාණය කරන 'ඩාන්' වාණිජ විද්‍යා උපාධිධාරියකු



වන අතර ඔහු දැනට අවුරුදු 24 ක සේවා කාලයක් මෙම අභය භූමියේ ගෙවා ඇත. ඩාන් ගේ පරම්පරාවම සතුන් කෙරෙහි බෙහෙවින් සංවේදී පුද්ගලයන් වීම විශේෂයක් වන්නේය. ගෙවුන දශක හතක කාලයේදී ඩාන් ගේ පරම්පරාවේ උදවිය විසින් වන ජීවීන් වෙත දක්වන ලද ලෙන්ගතු සිත සහ බැඳීම ඉතාම විශිෂ්ටය. දශක හතරක් මුළුල්ලේ සිය පියා මෙම අභයභූමියට සිදු කරන ලද සේවාවන් ඉදිරියට ගෙන යන්නට ඩාන් ඉදිරිපත් පිය.

දඩයම් බල්ලන්ගෙන් මෙන්ම අභයභූමිය අවට සිටින ජනපද වාසීන්ගෙන් කළු මුවන්ගේ ජීවිත රැකී ඇත්තේ කෙසේද යන්නත් අද බොහෝ දෙනාගේ විමතියට හේතුවී ඇත. මේ ආරක්ෂාව කළු මුවාට ලැබෙන්නේ කෙසේද යන්නට පිටුබල වූ නොපෙනෙන හේතුවක් ඇත. ඉන්දීය ජන ජීවිතය තුළ කළු මුවා වාසනා සම්පතක් සේ සලකනු ලැබේ. කළු මුවන් විසින් ප්‍රදේශයට ලබා දෙන ආශිර්වාදය ප්‍රබලය යන ඇදහිල්ල නිසාම මුව දඩයම ඔවුන් අකැප සේ සලකති. නියං කාලවලදී මුවන්ට අවශ්‍ය ආහාර පාන ලබා දී ඇති කර ගත් මුව මිනිස් සහජීවනය තුළ කළු මුවාට ජීවත් වීමේ වාසනා ගුණය ඉතිරිව ඇති බව අමතක නොකළ යුතු ය. ❑

**පුනන්‍යා චාන්දනී ද සිල්වා**